# හරමානිස්ලා සහ කුල්ටෝ

ඉංගිරිසින් විසින් සකස්කරන ලද අධ්‍යාපන පාඨමාලා නිර්දේශ සහිත වුව ද සිංහලෙන් දෙන ලද අධ්‍යාපනයට භික්ෂූන් වහන්සේ යම් ආකාරයකට මැදිහත් වූ බව අපි දුටුවෙමු. සිංහලෙන් දෙන ලද අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත්කළ පිරිවෙන ඒ අධ්‍යාපන ක්‍රමයෙහි මුදුන්මල්කඩ බඳු විය. ඉංගිරිසින් විසින් ඇංග්ලිකන් ක්‍රිස්තියානි පූජකවරුන්ගේ නායකත්වයෙන් පිහිටුවන ලද අධ්‍යාපන දෙපාර්තමේන්තුවක් යටතේ වුව ද එවැනි තත්වයක් පවත්වාගෙන යෑම භික්ෂූන් වහන්සේ ද සිංහල බෞද්ධ ගිහියන් ද ලැබූ ජයග්‍රහණයක් විය. එහි දී පෙන්නුම් කෙරුණේ අන් කිසිවක් නොව භික්ෂූන් වහන්සේ ඉංගිරිසි පාලන කාලයේ දී වුව ද මෙරට සාමාන්‍ය ජනයාගේ විය්ද්කුන් වහන්සේ වූ බව ය.

එහෙත් අප කලින් සඳහන් කළ පරිදි පිරිවෙන පැරණි අධ්‍යාපනයක් ලබාදෙන, නූතන ලෝකයට නොගැලපෙන ආයතනයක් ය යන අදහස ක්‍රමයෙන් ජනතාවට කාන්දු විය. පිරිවෙනේ නායකත්වය ලැබූ සිංහල මාධ්‍යයෙන් ඉගැන්වුණු පාසල්වලට ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට නොගැලපෙන්නේ ය යන සහතිකය ලැබිණි. එමෙන් ම සිංහල පාසලක ඉගෙන ගත් අයකුට ලැබුණේ සීමිත රැකියා කිහිපයකි. මේ කරුණු හේතුවෙන් ගම්වල ද ප්‍රභූහු තම දරුවන්ට ඉංගිරිසි පාසලක අධ්‍යාපනය ලබාදීමට උත්සාහ කළහ. ඒ ප්‍රභූන් අතර වැඩි පිරිසක් සිංහල පාසල් ගුරුවරු වෙදමහත්වරු වූහ.

නිදහස් අධ්‍යාපනය හා මධ්‍ය මහා විද්‍යාල ඔස්සේ එක් අතෙකින් ඉංගිරිසියෙන් දෙනු ලැබූ අධ්‍යාපනය ගමට ගෙනියනු ලැබූ අතර අනෙක් අතින් එතෙක් ඉංගිරිසියෙන් පමණක් දෙනු ලැබූ හා භික්ෂූන් වහන්සේගෙන් උදුරාගනු ලැබූ අධ්‍යාපනය නොමිළයේ සිංහලෙන් ද දීමට කටයුතු කෙරිණි. වෙනත් ආකාරයකින් කිවහොත් ඉන් සිදුවූයේ බටහිර නූතනත්වයේ අධ්‍යාපනයේ නිම් වළලු පුළුල් කිරීමකි. අධ්‍යාපනය තව තවත් භික්ෂූන් වහන්සේගේ නායකත්වයෙන් ගිලිහී යෑමකි. එහෙත් ආරම්භයේ දී නිදහස් අධ්‍යාපනයට පක්ෂව හෝ විපක්ෂව හෝ ප්‍රතිචාර දැක්වූ අයට මෙය අවබෝධ කරගැනීමට හැකිවී යැයි සිතිය නො හැකි ය.

නිදහස් අධ්‍යාපනයට පක්ෂවූවන් සිතුයේ එමගින් අතළොස්සකට පමණක් සීමා වී තිබූ රැකියා හා වරප්‍රසාද බොහෝ දෙනකුට විවෘත වේ ය යන්න ය. එය ප්‍රගතිශීලි කාර්යයක් බව විශේෂයෙන් ම විද්‍යාලංකාර පිරිවෙනේ භික්ෂූන් වහන්සේ සිතන්නට ඇත. ප්‍රගතිශීලී යන වචනය ද විද්‍යාලංකාර පිරිවෙනේ නිර්මාණයක් විය. භික්ෂූන් වහන්සේගේ ප්‍රමුඛත්වයෙන් රට පුරා නිදහස් අධ්‍යාපනය ඉල්ලා පෙත්සම් අත්සන් කෙරිණි. එහෙත් මේ අධ්‍යාපනය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අධ්‍යාපනය බව ද එය ප්‍රචලිතවීමෙන් තමන් වහන්සේට සිංහලෙන් දෙනු ලැබූ අධ්‍යාපනයේ ලැබී තිබුණු නායකත්වය නැතිවන බව ද භික්ෂූන් වහන්සේට අවබෝධ කරගැනීමට ක්‍රමයක් නො වී ය.

අනෙක් අතට නිදහස් අධ්‍යාපනයට විරුද්ධ වූ කතෝලික පල්ලියට හා වෙනත් ක්‍රිස්තියානි පල්ලිවලට තමන් විරුද්ධ වන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අධ්‍යාපනය පුළුල් කිරීමට ය යන්න නො වැටහිණි. අදාළ පූජකවරුන්ට හා අනෙක් අයට අවශ්‍ය වූයේ වරප්‍රසාද හා ඊනියා උසස් රැකියා ලබාදෙන අධ්‍යාපනය අතළොස්සකට පමණක් සීමා කිරීමට ය. මේ දෙපිරිස බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනය ප්‍රචලිත කිරීම යන දෘෂ්ටි කෝණයෙන් ප්‍රශ්නය දෙස බැලුවේ නම් කුමක් සිදුවීමට ඉඩ තිබුණි ද?

එහෙත් අප බොහෝ විට ක්‍රියා කරන්නේ ප්‍රශ්නයක මුලට ම ගොස් නො වේ. අපට ප්‍රශ්නය ගෝචරවන ආකාරය අනුව අපි ක්‍රියා කරමු. අද අපි ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය යනුවෙන් හැඳින්වෙන ප්‍රශ්නයේ මුලට යෑමට අකමැති වෙමු. එය ත්‍රස්තවාදයක්, ජනවාර්ගික ප්‍රශ්නයක් ආදී වශයෙන් අප දකින්නේ එබැවිනි. නිදහස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නය එදා දුටුවේ වරප්‍රසාද හා පහසුකම් පුළුල්වීම පිළිබඳ ප්‍රශ්නයක් ලෙස පමණ ය. අද ද බොහෝ දෙනා ඒ දකින්නේ එලෙසින් පමණ ය. ඒ ඒ පුද්ගලයා ලෙස ගතහොත් ප්‍රශ්නය ඒ ආකාරයෙන් දැකිය හැකි මුත් රටක් ලෙස ගතහොත් ප්‍රශ්නය වෙනත් ආකාරයකට පෙනෙයි. බොහෝ දෙනාට සමස්ත ප්‍රශ්නය පළල් ආකාරයකින් දැකීමට නොහැකිවීම කණගාටුවට කරුණක් නමුත් ලොවේ කරුණු සිදුවන්නේ ඒ ආකාරයට ය.

© Prof. Nalin De Silva

පහලොස්වැනි සියවසින් පසුව අපට ලෝකය දැකීමට සිදුවන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යය අනෙක් රටවලට පැටවීමක් ලෙස ය. ඒ සමස්තයෙහි විවිධ දෑ විවිධ රටවල විවිධ ආකාරයෙන් සිදුවන බව සැබෑ ය. එහෙත් මූලිකව සිදුවන්නේ කුමක් ද යන්න ගැන අපේ අවධානය යොමු විය යුතු ය. ඇතැම් විට මෙරට නිදහස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නයේ දී සිදුවූවාක් මෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ඒජන්තයන්ට ද පොට වැරදෙයි. නිදහස් අධ්‍යාපනයෙන් සමස්තයක් ලෙස ගත්කල සිදුවන්නේ ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යය පැතිරීම බව තේරුම්ගැනීමට නොහැකි වූ එහි ඒජන්තයෝ එයට විරුද්ධ වූහ. ඒ අතර එමගින් අධ්‍යාපනයේ විශාල වපසරියක තම නායකත්වය නැතිවන බව තේරුම්ගැනීමට නොහැකි වූ භික්ෂූන් වහන්සේ එයට පක්ෂ වූහ.

ප්‍රශ්න හා ප්‍රශ්න විසඳීම ගැන එතරම් අවබෝධයක් නැති ඊනියා උගතකු මෙහි දී අපෙන් අසනු ඇත්තේ එසේ නම් භික්ෂූන් වහන්සේ කළයුතුව තිබුණේ නිදහස් අධ්‍යාපනයට විරුද්ධවීම ද යන්න ය. මෙරට ඈත අතීතයේ දී තිබුණේ නිදහස් අධ්‍යාපනය ඉතා ප්‍රශස්ත මට්ටමකිනි. භික්ෂූන් වහන්සේ අධ්‍යාපනයට මුදල් (කහවණු) අය නොකළා පමණක් නො වේ. එකල ශිෂ්‍යයන්ට ආහාර පාන ආදිය ද නොමිලේ සැපයිණි. ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ වෙනුවෙන් නම් එදත් අදත් සිවුපසය ලැබෙන්නේ මුදලකට නො වේ.

එබැවින් නිදහස් අධ්‍යාපනය යන්න අපේ සංස්කෘතියට නුහුරු සංකල්පයක් නො වේ. ඇතැම් විට අනෙක් කිසිම රටක නොමැතිව විශ්වවිද්‍යාලය දක්වාම නොමිලේ අධ්‍යාපනය ලබාදීමට කන්නන්ගර මහතාට සිතෙන්නට ඇත්තේත් ඒ සංස්කෘතික උරුමය හේතුකොටගෙන විය හැකි ය. එමෙන් ම භික්ෂූන් වහන්සේ එයට අනුබල දෙන්නට ඇත්තේත් ඒ නිසා ම විය හැකි ය. එහෙත් අපේ පැරණි නිදහස් අධ්‍යාපනය භික්ෂූන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් දෙනු ලැබිණි. පසුගිය හැටවසක පමණ කාලයෙහි නිදහස් අධ්‍යාපනය බටහිරයන්ගේ ආධිපත්‍යය යටතේ සිදුවෙයි.

භික්ෂූන් වහන්සේ කළ යුතුව තිබුණේ නිදහස් අධ්‍යාපනයට විරුද්ධවීම නොව ඉංගිරිසි අධ්‍යාපනය ද තමන් වහන්සේගේ නායකත්වය යටතට ගැනීමට ක්‍රියාකිරීම ය. සමස්ත අධ්‍යාපනය අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් මුදවාගැනීමේ සටනක් එදා ආරම්භ කෙළේ නම් අප වෙනත් මගක් ගැනීම දෙසට තල්ලුවීමට තිබුණි. එහෙත් ඒ එසේ නොසිදුවූවා පමණක් නොව ඉන් විසි වසරකටත් අඩු කාලයක දී පාසල් රජයට ගැනීමට කරන ලද උද්ඝෝෂණයේ දී අධ්‍යාපනය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යයට තව තවත් යටත් කෙරිණි. හතළිහේ දශකයේ දී ක්‍රියා කළාක් මෙන් හැටේ දශකයේ දී ද භික්ෂූන් වහන්සේ පාසල් රජයට පවරා ගැනීමට පක්ෂවත්, කතෝලික හා ක්‍රිස්තියානි පූජකවරු එයට විරුද්ධවත් ක්‍රියා කළහ.

මූලික ප්‍රශ්නය නිදහස් අධ්‍යාපනය හෝ පාසල් රජයට ගැනීම හෝ නොව අධ්‍යපනය කාගේ අධ්‍යාපනයක් ද, කාගේ ආධිපත්‍යයෙන්, නායකත්වයෙන් සිදු කෙරෙන්නක් ද යන්න ය. මූලික ප්‍රශ්නය හඳුනාගත් පසු එයට පිළිතුරුදීම අපහසු නො වේ. එහෙත් මූලික ප්‍රශ්නය හඳුනාගැනීමට අපොහොසත් වූ කල ප්‍රශ්න තව තවත් අවුල් වේ. භික්ෂූන් වහන්සේට එදා අධ්‍යාපනය තමන් වහන්සේගේ නායකත්වය යටතට ගැනීමෙහි ලා ප්‍රශ්න තිබුණි. අද ඒ ප්‍රශ්න එදාට ද වඩා මෝරා ඇත. එහෙත් එපමණකින් ප්‍රශ්නයට පිළිතුරු සෙවීමෙන් නිදහස් නො වේ. අද භික්ෂූන් වහන්සේගේ නායකත්වය යටතට අධ්‍යාපනය පවරා ගැනීම කිසිවකුට සිතෙනු ඇත්තේ දවල් සිහිනයක් දැකීමක් ලෙස ය. එහෙත් ඒ සිහින සැබෑ කිරීම අපහසු වුවත් නොකළ හැක්කක් නො වේ.

අද ද අධ්‍යාපනය භික්ෂූන් වහන්සේගේ නායකත්වය යටතට පත්කළ හැකි ය. එහෙත් එයට පළමු ගතයුතු පියවර රාශියක් වෙයි. ඒ පියවර මෙහි දී සාකච්ඡාකිරීම මගේ බලාපොරොත්තුව නො වේ. අප සලකා බලමින් සිටියේ නිදහස් අධ්‍යාපනය හා සිංහලෙන් බටහිර නිර්දේශයට අනුව අධ්‍යාපනය ලබාදීම පිළිබඳව ය. මධ්‍ය මහා විද්‍යාල පිහිටුවීමෙන් හා පළමුව නොමිලේ ඉංගිරිසි මාධ්‍යයෙන් හා පසුව සිංහලෙන් අධ්‍යාපනය ලබාදීමේ ප්‍රතිඵලය වූයේ එතෙක් නගර කිහිපයකට පමණක් සීමා වූ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යය අධ්‍යාපනය ඔස්සේ අනෙක් නගරවලට මුලදීත් ගම්බදට පසුවත් පැතිර යෑම ය. ඒ සමග එතෙක් ගම්වල භික්ෂූන් වහන්සේට තිබූ නායකත්වය කෙමෙන් උන්වහන්සේගෙන් ගිලිහීමට පටන් ගැනිණි.

© Prof. Nalin De Silva

පාසලේ බෞද්ධ සංස්කෘතිය පාලි ආදී විෂය ඉගැන්වූ නමුත් වැදගත් තැනක් ලැබුණේ බටහිර විද්‍යා විෂයට ය. ඉන් පසු සමාජයීය විද්‍යා නමින් හැඳින්වෙන විෂයයන්ට ලැබිණි. බෞද්ධ සංස්කෘතිය ආදී විෂයනට තැන හිමි කෙරුණේ නොවැදගත් යන විශේෂණ පදය සමගින් ය. ඒ විෂය වැදගත් නොවීමත් භික්ෂූන් වහන්සේ තමන්වහන්සේගේ විෂය ලෙස සිංහල, පාලි සංස්කෘත, බෞද්ධ සංස්කෘතිය ආදිය පමණක් තෝරාගැනීමත් නිසා සිදුවූයේ භික්ෂූන් වහන්සේ අධ්‍යාපන ක්ෂෙත්‍රයෙහි නොවැදගත් පුද්ගලයන් බවට පත්වීම ය.

මේ වැදගත් නොවැදගත් බව දැනට දශක කිහිපයකට පෙර පේරාදෙණි විශ්වවිද්‍යාලයෙහි දක්නට ලැබිණි. එකල එහි පෙරදිග අධ්‍යයන පීඨය (Faculty of Oriental Studies) හා ශාස්ත්‍ර පීඨය (Faculty of Arts) යනුවෙන් විද්‍යා නොවන පීඨ දෙකක් තිබුණි. පෙරදිග අධ්‍යයන පීඨයෙහි හදාරනු ලැබුයේ සිංහල, දෙමළ, පාලි හා සංස්කෘත වැනි භාෂා හා බෞද්ධ දර්ශනය හා සංස්කෘතිය වැනි විෂයයන් ය. ශාස්ත්‍ර පීඨයෙහි ඉතිහාසය, භූගෝල විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව ආදී විෂය හදාරනු ලැබිණි.

ඒ පීඨ දෙකේ ඊනියා වැදගත්කම පිළිබඳ මතයක් ගොඩනැගී තිබුණි. ශාස්ත්‍ර පීඨය පෙරදිග අධ්‍යයන පීඨයට වඩා උසස් ලෙස සැලකිණි. ඒ පීඨ දෙකෙහි වැදගත්කම කීමට මෙන් ශාස්ත්‍ර පීඨයෙහි සිසුහු කුල්ටුර් හෙවත් කුල්ටෝ නමින් හා පෙරදිග අධ්‍යයන පීඨයෙහි සිසුහු හරමානිස්ලා හෙවත් හරාලා නමින් හඳුන්වනු ලැබූහ. කුල්ටුර් යනු සංස්කෘතිය හඳුන්වන ජර්මන් වචනයකි. මෙයින් කියැවුනේ ශාස්ත්‍ර පීඨයෙහි ඉගෙනගත් සිසුන් සංස්කෘතියක් ඇති පිරිසක් බවත් පෙරදිග අධ්‍යයන පීඨයෙහි සිසුන්ට සංස්කෘතියක් නැති බවත් ය. එයින් ලැබුණු පණිවුඩය ඉතා පැහැදිලි ය. සංස්කෘතිය යනු බටහිර සංස්කෘතිය විය. සිංහල බෞද්ධ සංස්කෘතිය ඇතුළු පෙරදිග සංස්කෘති වචනයේ පරිසමාප්තාර්ථයෙන් සංස්කෘති නො වී ය. හරමානිස් යැයි එකල නම් කෙරුනෝ අහිංසක දුප්පත් ගැමි දරුවෝ ය. ඉංගිරිසි බැරි ඔවුන්ට සංස්කෘතියක් තිබිණි යැයි නො සැළකුණි. .

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva